


**මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල/ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පි (වඩු කාර්මික)11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධීක්ෂණ නිළධාරින් විසින් පවරනු ලබන, දොර, ජනෙල්, මේස පුටු හා අනෙකුත් භාණ්ඩ සෑදීම. වහලවල් තැනීම, උළු හෝ සිටි ඇතිරීම. දැව සාම්පල් තේරීම, කොන්ක්‍රීට් අච්චු (ෂටරින්) සෑදීම, සිවිලිම සවි කිරම, පාටීෂන් බිත්ති සෑදීම, වැහි පීලි සවි කිරම, පලංචි සවි කිරම ආදී වඩු වැඩ ඇතුළු වෙනත් දෑ කිරම.

**රැකියාවේ වගකීම් :**

I වඩුකාර්මික වැඩ කිරීමේදී ජව බලයෙන් සහ විදුලි බලයෙන් ක්‍රියා කරන වඩු වැඩ යන්ත්‍ර සහ උපකරණ ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම හා නඩත්තු කිරීම.

11 වහලවල්, සීවිලිම් ආදිය කඩා ඉවත් කිරීම.

111 එදිනෙදා පවරනු ලබන වැඩ හා භාවිතා කරන ද්‍රව්‍ය පිළිබඳව වාර්ථා තබා ගැනීම.

1V අධීක්ෂණ නිළධාරීන් නොමැති විට පණිවුඩ භාරගැනීම සහ අප්‍රමාදව එය ඔවුන්ට ලැබීමට සැලැස්වීම.

V රාජකාරී ඉටු කිරීම සඳහා විටින් විට නිකුත් කරන උපකරණ සහ ද්‍රව්‍ය වල වගකීම දැරීම.

VI රාජකාරී කාලය තුළ නිල ඇඳුමින් සැරසී සිටිම, එහි පිරිසිදු භාවය ගැන සැළකිලිමත් වීම හා රාජකාරී ස්වභාවය අනුව ආරක්ෂක ආවරණ පැළඳ සිටීම.

VII සේවා මුර ක්‍රමය යටතේ සහ හදිසි අවශ්‍යතා මත පවරනු ලබන අතිකාල වැඩෙහි යෙදීම.

VIII ස්වකීය භාරයේ පවතින භාණ්ඩ හා උපකරණ පිරිසිදුව හා ආරක්ෂාකාරීව භාවිතා කර නැවත බාර දීම

IX අත් උදව්කරුවන් නොමැති අවස්ථාවලදී, ගබඩාවෙන් උපකරණ හා අමුද්‍රව්‍ය ලබා ගැනීම, වැඩ කරන ස්ථානයට ඒවා රැගෙන යාම සහ උපකරණ හා ඉතිරි ද්‍රව්‍ය නැවත ගබඩාවට බාරදීම

X පලංචි බැඳීම සඳහා බඩු භාර ගැනීම, පලංචි සවි කිරීම සහ ගැලවීම හා ඒවා නැවත භාර දීම.

02/-

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වඩු කාර්මික ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය සහතිකයක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ (NVQ Level 4) සහතිකයක් වඩු කාර්මික ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/ පාඨමාලාව කාලසීමාවද /පුහුණු කාලසීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**වැටුප :** තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සමාගමට අයත් දිවයිනේ පිහිටි ඕනෑම ස්ථානයක සේවය කල යතු වේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතයක් පහත සඳහන් ලිපිනයට 2025 **ඔක්තෝබර් මස 27 වන දිනට** පෙර ලැබෙන සේ **ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ **වම් කෙළවරේ අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

**සුදුසුකම් සනාථ කිරීමට අදාල සහතික වල ජායා පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අනුමත මාධ්‍ය වලින් හැර වෙනත් මාධ්‍යයන්ගෙන් ඉදිරිපත් කරන අයදුම්පත් සහ අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනෙන් පසුව මෙම කාර්යාලය වෙත ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.**

**සභාපති**
**ගුවන් තොටුපොල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Adv. : 05/10/2025